# ලංකාවේ පශ්චාත් යුධ සමයේ මුහුදු වැදි ජනතාව කෙරෙහි සිදු කළා වූ සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යනයක් (වාකරේ ප්‍රදේශය කුංජම්කල්කුලම්, මේවාන්ඩකුලම් හා මිනිමිත්තිවිල යන ගම්මාන ඇසුරින්)

සේපාල සමරසේකර, ඒ.ඒ.සී.එන්.අමරකෝන්, එච්.එම්.කේ.ජී.දුෂ්මන්ත,
ඒ.පී.කේ.සී.ගුණවර්ධන, ඩබ්ලිව්.කේ.එම්.විජයරත්න
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
Chathurungani@gmail.com , wkmyc94727@gmail.com

ශ්‍රී ලාංකාවේ දඹාන, හෙන්නානිගල, පොල්ලෙබැද්ද, රතුගල, නිල්ගල ආදී ප්‍රදේශවල විසූ ආදිවාසී ජනතාව මහවැලි සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර යනාදී පළාත්වල ස්ථාපිත කරනු ලැබීය. මෙයිනුදු වාකරේ, ත්‍රිකුණාමලය යනාදී මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රය කොටගෙන පදිංචි වූ ආදිවාසී ජනතාව "මුහුදු වැද්දන්" ලෙස හදුන්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ පැවති 30 වසරක යුද්ධය නිමාවත් සමඟ අවතැන් කඳවුරු වල සිටි මුහුදු වැදි ජනතාවට රජයෙන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානද මැදිහත් වීමෙන් නිවාස හා යටිතල පහසුකම් ආදී සංවර්ධන ව්‍යාපෘතීන් මුහුදු වැදි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. කෙසේ වුවත් මෙකී යථාර්තවාදී සංවර්ධන ක්‍රියාවලියක ප්‍රතිඵල වාකරේ මුහුදු වැදි ජනතාව ලැබුවේද යනාදී කරුණු මෙහිදී විමසුමට ලක් කිරීමට අප බලාපොරොත්තු වේ. මෙහිදී ආදිවාසී ජන නායකයන්ද ඇතුළත් වන පරිදි නිශ්චිතව තෝරාගත් පවුල් 20ක් ආශ්‍රය කොට ගෙන සම්මුඛ පරීක්ෂණ උප ලේඛණයක් ආධාරයෙන් සහභාගීත්ව නිරීක්ෂණය යටතේ අදාළ දත්ත රැස් කිරිම සිදු කරන ලදී. කුංජම්කල්කුලම්, මේවාන්ඩකුලම් හා මිනිමිත්තිවිල යන ගම්මානයන්හි සිදුවූ නිවාස සංවර්ධන ව්‍යාපෘති නිසි සැලැස්මක් නොමැති වීම හේතුවෙන් නිවාස ඉදිකර සුළු කාලයක් තුල සෑම නිවසක්ම අබලන් තත්වයට පත්ව ඇත. මෙම සමඟම ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්වය වැඩි දියුණු කිරීමට සෑම නිවාසයකටම වැසිකිලිය බැගින් ලබා දුන්නද ඔවුන් එම වැසිකිලි වෙනත් කාර්යයන් සඳහා භාවිතා කරනු ලැබේ. මුහුදු වැදි ජනයාගේ ජීවන තත්වය නඟා සිටුවීමට සිතා ලබා දුන් සතුන් ශීත දේශගුණයක් පවතින ප්‍රදේශ වලින් ගෙන ඒම නිසා වාකරේ වැනි උෂ්ණාධික ප්‍රදේශයකට ඔවුන් ඔරොත්තු නොදීමෙන් වැඩි සතුන් ප්‍රමාණයකට මරණය උරුම විය. සංවර්ධන ක්‍රියාමාර්ග ඇති කිරීමට ලබා දුන් සේවාවන් හා භාණ්ඩයන්හි වටිනාකම පිළිබඳව අවබෝධයක් නොමැතිකම හේතුවෙන් එම සම්පත් ගම තුළම දිරා පත් වෙමින් පවතී. මෙහිදී අවසාන වශයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ සංවර්ධනය මුවාවෙන් ක්‍රියාත්මක වී ඇති සංවර්ධන ව්‍යාපෘතීන් තුළින් සැබෑ ලෙසින්ම ජනතාව ආර්ථික, සංස්කෘතික සූරා කෑමකට ලක්ව ඇති බවයි.

**ප්‍රමුඛ පද** - සංවර්ධනය; සංවර්ධන ව්‍යාපෘති; මුහුදු වදි ජනතාව; පශ්චාත් යුධ සමය